ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 1577/4 - 2008 නොවැම්බර් 25 වැනි අඟහරුවාදා - 2008.11.25
(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

විධාන අංකः 27.

**2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1) (අ) වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1) (අ) වගන්තිය යටතේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පුරවන ලද ගෘහස්ත සහ/හෝ කාර්මික ද්‍රවීකෘත පෙට්‍රෝලියම් ගෑස් (LP Gas) සිලින්ඩර විකිණීමට බලයලත් සෑම වෙළෙන්දෙකු හෝ බෙදාහරින්නෙකු විසින් පුරවන ලද ගෑස් සිලින්ඩර විකිණීමේදී තම වෙළෙඳසැලෙහි/මධ්‍යස්ථානයෙහි ප්‍රකටව පෙනෙන කොටසක හෝ ස්ථානයක, පාරිභෝගිකයාට අවශ්‍යවේ නම් ඔවුන් විසින් මිලදී ගනු ලබන සිලින්ඩරවල බර, මිලදී ගැනීමට පෙර කිරා බැලීම සඳහා මිණුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව විසින් නිරවද්‍යතාවය ප්‍රත්‍යක්ෂණය කරන ලද සහ ඕනෑම වර්ගයක පුරවන ලද ගෑස් සිලින්ඩරයක බර කිරා බැලීමට හැකි තරාදියක් තැබිය යුතු බවට සියලු වෙළෙඳුන් හා බෙදාහරින්නන් වෙත මෙයින් විධාන කරනු ලැබේ.

මෙම විධානය වර්ෂ 2008 දෙසැම්බර් මස 01 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2008 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

12-308

1A - G 010483—580 (2008/11)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.